# නිර්මාණ Nirmana

## හෙළ අවුරුදු සිරි !

අස්වනු නෙලාගෙන ගොස් වී අටු පුරවා
අළුතින් නිවෙස් හැම සුණු පිරියම් කරවා
අවුරුදු කුමරි පිළිගන්නට සිත පිනවා
හෙළ දූ පුතුන් සැරසෙති වැඩපළ නිමවා

අඹ දඹ කෙසෙල් අන්නාසිද පැණි වරකා
රසබර සුවඳ වැහෙන පලවැල නොයෙකා
තුරු අග සුපිපි මල්වල සුවඳත් නිසැකා
සුවයක් ලබා දෙයි සෝ ළතැවුල් වළකා

පාසැල් නිවාඩුව ලැබුණෙන් සැනසිල්ලේ
සෙල්ලම් කරති දරුකැල වෙල් ඉපනැල්ලේ
දිය බුං ගසත් පීනා ගෙඅසළ ඇල්ලේ
තුටුවෙති සිත් ලෙසින් සුවවිඳ සිහිලැල්ලේ

අතිරස ආස්මී අළුවා කැවුම් කොකිස්
පැල්පත මැදුර යයි කිසි ලෙස නැතිව වෙසෙස්
හැම නිවසකම ඇත හැමවිට නොකරම හිස්
නෑ හිතවතුන් හට සලකති ලෙසින් උසස්

වෙඩි හඬ රබන් හඬ නැගළුයි සවන පුරා
මල් කුමරියන් ඇත එරබදු යහන අරා
රැව් දෙයි කොවුල් ගී හඬ දුක් අඳුර ඉරා
හිරු කුමරුන් වඩී කලදෝ එළිය පෙරා

මව්පිය නෑසියන් හා මිතුරන් කළණ
දක්නා රිසින් යති බැතියෙන් ගෙන තිළිණ
යුද බිය ඇතත් ලක තුළ කරදර දෙවන
අවුරුදු සිරිත් පවතී සහනය ගෙනෙන

*විශ්‍රාමලත් විදුහල්පතිනි*
♦ *ප්‍රේමා අදිකාරි*
Morden **Surrey UK**

## බක්මහ සිරියාව

සියොතුන් ගී හඬට මල් පිපෙමින් බැද්දේ
කෙළ සෙල්ලම් රබන් හඬ දෙයි ගම් මැද්දේ
නැකතට රතිඤ්ඤා ගිගිරුම් දෙන සද්දේ
බක්මහ සිරියාව සිංහළ අවුරුද්දේ

නළමුදු සුවඳ විඳ සිහිලැල් සඳ පානේ
ඔන්චිලි පදින ගැමි ළලනාවන් රැණේ
කෝමල සිනා කැල්මට රුබර මූණේ
අවුරුදු සිරියාව ඉතිරෙයි ගම් මානේ

සැහවී අතුපතර කොවුලිඳු හඬ තලනා
එරබදු මල් පිපී රතුපාටින් දිලෙනා
පීදී ගොයම් කෙත් සරුසාරව රහනා
බක්මහ මඟුල්සිරි මට සිහියට නැගෙනා

ලක්බිම පුරා කිරි ඉතිරුණු බක් මාසේ
අවුරුදු සිනාවෙන් ඔකඳව තිබු මාසේ
කෝ ඒ සිනා හඬ අද කිසිවක් නැසේ
කඳුලක් නැගී ඇත ලක්මැණිගෙ දෑසේ

වැඳුණද නොයෙක් දුක් කරදර හද වතට
එකමුතු වෙමින් කමු අපි අවුරුදු රසට
පෙන්වා ඉදිරි මග අප පොඩි පර පුරට
ගෙන එමු සතුට සම්පත සිංහළ රටට!

♦ *Dr නෙත්මි චාන්දනි කරුණාරත්න*
**Gtr. Manchester UK**



## අවුරුද්දයි ගමයි !

රතුපාටට එරබදු මල් සේල එලෙන් නේ
කොවුල් ගීත නාදය සවනට රස දෙන් නේ
කැවුම් කොකිස් සුවඳයි දස අත පැතිරෙන් නේ
අවුරුදු සිරියාවෙන් මුලු ගම එළි වෙන් නේ

ඔන්චිලි චිලි චිලි ඔන්චිල්ලා උඩ යන් නේ
පංචි කෙළිය ඔලිඳ කෙළිය බාල ළමුන් නේ
නැකතට සිරිතට නිරතුරු මුල් තැන දෙන් නේ
කඳ මලු බැඳ සතුටු සිතින් නෑ ගම් යන් නේ

ගම එළිවන අවුරුදු සිරි කවුද නොදන් නේ
අවුරුද්දට ගමටයි ඉගිලෙන්න හිතෙන් නේ
එහෙම ගමක් දැන් නැති බව සැවොම කියන් නේ
කොහේ නැතත් ඒ ගම මගෙ හිතේ තියෙන් නේ

♦ **ශ්‍රීපාලි කොටුවැල්ල**
**Arleta, Ca, USA**




## මට හිතෙනවා සිරිලක දැක මියෙන්නට

රබන් සුරල් හඬ දසතින් ඇසෙන් නට
කොහා ගයන සුමිහිරි ගී අසන් නට
වාරම් කියා ඔන්චිල්ලා පදින් නට
බක්මහ සැබෑ අසිරිය විඳ බලන් නට

කැවුම් කොකිස් කිරිබත් රස බලන් නට
කිරි ඉතිරෙන පෙණ පිඩු නෙත පිනන් නට
මගෙ නිවහනේ අවුරුදු සුව විඳින් නට
මට හිතෙනවා සිරිලක දැක මියෙන් නට

හෙළ බස රකින්නට රට දැය වඩන් නට
පන්හිඳ තුළින් හරවත් දෑ කියන් නට
ගෙවු දිගු සමය තුළ වෙරගති දිනන් නට
මට හැකි වුනිද මගෙ ලක්මව පිනන් නට

ලෝකය පුරා විසිරුණ හෙළ දැයෙහි දරු
නොනැවති වෙහෙස විඳ ලක්මව රකින යුරු
උපන් බිමෙහි මගෙ පා යුග තබන තුරු
අවුරුදු මිහිර පිටරට හිඳ විඳිනු බොරු

♦ *නිරංජලා මනෝහාරි*
**Nicosia Cyprus**

## මුළු රටටම පවන් සලන අවුරුද්දේ මඟුල් සිරිය

නීල කොබෙයි රැන කොවුල් තාලයකට ගී ගයද්දි
ඔංචිලි චිලි චිල්ල මලේ අතු අග එරබදු හිනැහෙයි

මීඅඹ කජු මොර ඉදිලා රබන් හඬින් සුළඟෙ නටයි
අවුරුද්දේ මඟුල් සිරිය මුළු රටටම පවන් සලයි

බත බුලතින් සාරවෙලා නිවහල් සිතුවිලි පුබුදයි
උතුරු කොණයි දකුණු කොණයි
එකම සිතින් එක්ව බැදෙයි

පන්සල් කෝවිල දෙව්බිම සංඛා නද දසත ඇසේ
කරල් කැපූ රන් ගොයමේ කිරි සුවඳින් ගම නැළැවේ
තුන් සිංහළයම බැඳෙනා ඒ යායයි මේ යායයි
දෙරණ සිඹින සඳ හිරු මල මුළු රටටම කිරි ඉතිරෙයි

♦ *ධම්මි විජේසිංහ*
Mississague, **Canada**

## රණවිරු උපහාර !

පතුරා බලය උතුරේ අහුමුළු නැර
රට සුරකිනා සෙබළුනි වීරෝදාර
සිතමින් ඔබේ දස්කම් ගැන සුරුවීර
ලන්ඩන් ඉඳන් ඔබටයි මේ උපහාර

රට රැක්මට යුද බිම වෙත ගිය විරුවෝ
රට වෙනුවෙන් සිය ජීවිත පුද කෙරුවෝ
රට වැසි සැමගෙන් ගරු බුහුමන් ලැබුවෝ
නොරටක වෙසෙනා අප නෙත් යුග තෙමුවෝ

දිවි නොතකා දරා බිහිසුණු යුද අවිය
යුද පෙරමුණට ගිය පෙන්වා සිත එඩිය
විරු සොයුරණේ ඇති ගත සිත නිසි සවිය
ජීවිත වලට ඔබගේ අප ණය ගැතිය

තෙරුවන් බෙලෙන් දුක් පීඩා දුරුවෙන් නයි
දෙවියන් පිහිට ලැබ ගිය තැන ජයගන් නයි
සිදෙමින් බේද රට එක සේසත් වෙන් නයි
සතුටින් සාමයෙන් ලක්මව බැබළෙන් නයි

♦ *කුමාරි විජේරත්න*
Hounslow Middx **UK**

## නොරට අවුරුදු

සක් වල ගලට මෙපිටින් සිටියත් අදට
ඉක් මන් සිතක් ඉගිලෙයි දුර මව් බිමට
දුක් මුසු බවක් නොමඳව දැනෙනුය සිතට
බක් මහ සීතලය නවසීලන් තයට

ගෙවිලා වසන්තය සිසිරය ළං වෙනවා
අ කු ලා කිරණ වැල් රිවිසර හැං ගෙනවා
නැමිලා අතු රිකිලි සුළඟට මුමු ණනවා
මැ වි ලා වගේ මව්බිම සිහියට එනවා

සු දු ව න් වළාකුළු රතයක නංවාන
ර න් ව න් බරණ රතු සළුපිළි අන්දාන
කල් යල් බලා සුබ නැකතින් සමරාණ
කුමරුන් වඩිනු ඇත අවුරුදු කැන්දාන

කොවුලා හඬන විට බැද්දේ හැංගි හොරා
එරබදු පිපෙනු ඇත දිගටම දෙවට පුරා
ගෙවදින නෑ සියන් කඳ මළු බරට දරා
නිසැකව අසනු ඇත පොඩ්දුව කොහිද කියා

නැකතට පැසෙන කිරිබත කන්නේ කවුද
සි රි ත ට නානු ගෑ අත්තා යළි එයිද
ම වු න ට පියාහට දරු දැකගත හැකිද
දෙදණට වාරු දී පා නමදිනු ඇතිද

පර දේශයක හෙළ අවුරුදු සිරිය නැත
සිරිතට තැනක් දෙන කිසිවෙකු අසල නැත
හදවත පුරා ඉතිරුණු මතකයක් ඇත
විඳගනු විනා කළ හැකි අන් දෙයක් නැත

♦ *ශ්‍රියා කුමාරසිංහ*
**Dunedin, New Zealand**

## සැණකෙළියක හපන්කම

සිහි ගන්වමින් එරබදු මල් පිපෙන සමේ
මිහි කත වසන්තයෙ අරුනළු රැසක තෙමේ
විහි දෙන කොවුල් ගී හඬ දෙසවනට හැමේ
ඉහි ලුම් නොමැත අවුරුදු අසිරියට ගමේ

එ ක කුස උපන් දරුවන් ලෙස සියළු දෙනා
රැක ගෙන මිනිස්කම තම උරුමයට ගෙනා
වික සිත කුසුම් ලෙස මතුකොට මුවග සිනා
සක සමු දිවි ගමන අවුරුදු පැතුම දිනා

ගෙන් පිට ගියපු දූ දරු නෑසියන් හැම
ළ ං වේ බක්මහට දැකුමට උපන් ගම
ඉ න් ඇතිවන සතුට උතුරා දසන් තෙම
පෙන් නුම් කෙරේ සැණකෙළියක හපන් කම

වැ ඩි හිටි ගුරු දෙගුරු පුද දී බත බුලතින්
දැ ඩි ලෙස මිහිර ලැබගෙන අවුරුදු නැකතින්
පො ඩි ලොකු සැවොම දැවටී සමගියෙ දොහොතින්
කොඩි වැල් දිලේවා හෙළ දිවයින දසතින්

♦ *මුලන - දයා නානායක්කාර*
**හුංගම Sri Lanka**



## අවුරුදු සිහින

අළුත් අවුරුදු කුමරු වඩින සඳ පෙර ගිරේ
මලානික වන වදුලු සිනා පැහැයෙන් පිරේ
ඇත්වී හිතවතුන් දෙමාපිය සනු හරේ
සුසුම් පසුතැවිලි මිස කුමක් වෙද බට හිරේ

දොළොස් මස් ගෙවී එන සිරියාව බක් මහේ
ගව් ගණන් දුර නමුදු සිතින් සහවනු නොහේ
ගෙදර කලළුළි වෙවී ඉදෙයි රඹකැන් ගහේ
එවන් සිරි යළිත් මා දකිනු කවදා කොහේ

නැකැත් සැණ එනතුරා වෙලා ගැණ ගැණ ඉන්න
අළුත් ඇඳුමෙන් සැදී පහන් වැටි දල් වන්න
රතිඤ්ඤා හඬ අසා උදෑසන පිබි දෙන්න
අනේ! ආසයි මටත් යළිත් ගම රට යන්න

බැදේ ඔන්චිලි ගසේ නැගුණු සඳ ගුවන් යන
මිදේ කිරි ඇතිලියෙහි පැහැය සිත් පහන් වන
ඉදේ රඹකැන් ගහේ සුවඳ නොයිවසුම් වන
බිදේ දොම්නස මැදින් රබන් හඬ ගිගුම් දෙන

වැටේ එරමුදු ගසේ හැඩට රතු මල් පිපෙන
ගමේ කජුගස් මුදුන කොහා පිළිරැව් නගන
කැවුම් කිරිබත් සුවඳ රබන් පද පිරි වැරුණ
දැනේවා! පෙනේවා! මටත් අවුරුදු සිහින

*මේ පැදි පෙළ මා ලියූයේ වසර 30 කට පෙර මා එංගලන්තයට පැමිණි වසරේ අප්‍රියෙල් මස සිංහළ අවුරුද්දට දින කීපයකට පෙරය. සිංහළ අවුරුද්දට මා මව්බිමෙන් ඈත්ව සිටි ජීවිතයේ ප්‍රථම වතාව එය වූ බැවින් එදා මා තුළ වූ සාංකාව ඉමහත් වීය. මෙම කවි පන්තිය ඒ සතියේ සිළුමිණ පත්‍රයේ පළවී තිබුණි.*

♦ *දයා ආනන්ද* **London UK**

## බක්මහ සසිරිය

ළහිරු කිරණ
හොරෙන් හොරෙන්
තුරුවැල් අතරින් පායන
ලස්සන මගෙ මිදුල පුරා
විලම්භීත රටා මවන

බුලත් හුරුළු අතේ දරන්
අම්ම තාත්ට වඳින්න
සීයට ආච්චිට වැඳලා
නව වසරට පා නගන්න

එරබදු ගහ මුදුනේ සිට
කොහා ගයන ගී අහන්න
පුංචි ළමයි දුව ඇවිදින්
නගන සිනා බලාගන්න

රතිඤ්ඤා ගහ උඩ තියලා
පත්තුකරල දුවල යන්න
කන් වහගෙන හරි හරියට
ඒ දෙස හොරැහින් බලන්න

හිස තෙල් ගානා නැකතට
අහල පහල නෑයො සමග
ඔච්චම්කර හිනාවෙවී
ගමේ සාදු ළඟට යන්න

කුඹුක් ගස්වලින් වටවුණු
වෙළ අයිනේ පිරුණු ළිඳට
කාසි දෙක තුනක් දමලා
කළ පිරෙන්න දිය අදින්න

අඹගහ යට සෙවනැල්ලේ
පැදුරක් ගෙනැවිත් එලාන
රංචු පිටින් වාඩිවෙලා
ඔළිඳ කෙළින හැටි බලන්න

නොමැත නමුත් වාසනාව
සමරන්නට අවුරුදු මෙම
ටියුලිප් මල් ලන්තෙ ඉඳන්
ලියනෙමි කවි දුක නිසාම

♦ *එරංගා පෙරේරා*
**Netherlands**

## සෙබළ බිරිඳකගේ කවිය

සතුරු බල බිඳලමින් පෙරමුණට
පා නගා විරුවෙකුව යුදබිමට
ඔබ පුද කළ මෙහෙය මව්බිමට
අබිමනකි සදා බලසෙන් පිරිවරට

ඔබ මියගිය පුවත
තුඩ තුඩ පැතිර සවනත
අදහනු නොහැකි ඒ බස
මං මුලාවී ඇත මගේ සිත

නොලදිමි කසී සළු වත
නොපුදමි සළෙලුනට මා ගත
ජන්ම නොලදිමි කිඹුල් වත
එහෙත් සපුරමි යසෝදා වත

♦ *සන්ධ්‍යානි සේනාරත්න*
Roehampton,
**London SW 15**

## අවුරුද්දයි ආවේ!

රතු තොල් පෙති විදහාගෙන
එරබදු මල් හිනැහේ
පලවැල අත් පුරවාගෙන
පලබර ගස් පිබිදේ
කොවුලන්ගෙයි රාවේ
අවුරුද්දයි ආවේ

ගම්මානෙට කුරුලු කැලේ
සංගීතය මුසුවේ
රංචු රංචු එහෙන් ඇවිත්
කුඹුරු යායෙ වැසුවේ
කොවුලන්ගෙයි රාවේ
අවුරුද්දයි ආවේ

ගේ දොර හැඩ වෙන තාලෙට
රෙදිපිළි ගෙට ගොඩවේ
කැවිලි පෙවිලි රස ආහර
බඩු මුට්ටුත් වැඩිවේ

වසන්තයයි බක්මාසෙට
මල් පාවඩ එලුවේ
පවන් රතේ සරසාගෙන
කුමාරයෙක් වැඩියේ
බක් මාසේ එක් දවසකි
සිත් සතුටින් හිනැහේ
දුක් අමතක ඒ දවසේ
දුප්පත් බව සැනහේ
කොවුලන්ගෙයි රාවේ
අවුරුද්දයි ආවේ

♦ *සිරි දන්තනාරායන*
**Sri Lanka**